# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2113/58 – 2019 මාර්තු 07 වැනි බ්‍රහස්පතින්දා – 2019.03.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/15/43/2010.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.09.09 වැනි දින අංක 1983/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.09.02 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්*

ඩී. එච්. පතිරණ මයා, අංක 207, වැලි පාර, දිගන නිලගම, දිගන.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

තැප්‍රොබේන් ස්ටුඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 50, රජ මාවත, ඇතුල් කෝට්ටේ පාර, නුගේගොඩ.


1A – G 29598 – 31 (2019/03)

*මෙම අතිවිශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අතර පවත්නා 2016.07.18 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. විරිතමුල්ල මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2016.09.02 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

03 -1020/1

---

මගේ අංකය: IR/15/43/2010.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ

## 4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්:*
ඩී. එච්. පතිරණ මයා, අංක 207, වැලි පාර, දිගන විලේජ්, රජවැල්ල, දිගන.
සහ
*අනෙක් පාර්ශ්වය වශයෙන්*
තැප්‍රොබේන් ස්ටුඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ්, චන්ද්‍රම් රත්නම් ඒෂියන් ෆිල්ම් ලොකේෂන්, අංක 567/එච්/4, එකමුතු මාවත, තලවතුගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක. 128, එස්. විරිතමුල්ල මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/43/2010.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්:*

ඩී. එච්. පතිරණ මයා, අංක 207, වැලි පාර, දිගන විලේජ්, රජවැල්ල, දිගන.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්:*

තැප්‍රොබේන් ස්ටුඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ්, චන්ද්‍රම් රත්නම් ඒෂියන් ෆිල්ම් ලොකේෂන්, අංක 567/එච්/4, එකමුතු මාවත, තලවතුගොඩ.

*ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,*

තැප්‍රොබේන් ස්ටුඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන ලද ඩී. එච්. පතිරණ යන අයට 2007 ඔක්තෝබර් මස සිට 2009 සැප්තැම්බර් මස දක්වා වැටුප් හා දීමනා ලබා නොදී සේවය කළ කාර්යාලය වසා දමා සේවය අවසන් කිරීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 - 1020/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.